**ISBN 978- 955-4563- 71- 1**

# උඩරට සමාජයේ පාරම්පරික චාරිත්‍රයක් ලෙස පවතින ගෝදානය

**ඊ.ඩබ්ලිව්.ඒ. හසිත චාමිකර ගුණසිංහ**
**ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.**

**සංක්ෂේපය**

***භාරතීය හින්දු ආගමික චාරිත්‍රයක් වන ගෝදානයේදී විවිධ අරමුණු මුල්කොට ගෙන බ්‍රාහ්මණයන් උදෙසා ගවයන් පූජා කිරීම සිදුකරනු ලැබේ. කෘෂි අර්ථක්‍රමය මුල්කරගත් භාරතීය සමාජයේ ගවයාට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. මෙනිසා ගෝදානයට ද ආගමික මෙන්ම සමාජීය වශයෙන් වැදගත්කමක් හිමිව තිබේ. එය ලාංකිකයන් අතර ප්‍රචලිත චාරිත්‍රයක් බවට පත්වූයේ ලංකාවේ ද කෘෂි අර්ථක්‍රමයක් පැවතීම හේතුවෙනි. ලංකාවේදී බෞද්ධාගමික මුහුණුවරක් ආරෝපණය කෙරුණු ගෝදාන චාරිත්‍රය, මහනුවර යුගයේදී අතිශය ජනප්‍රිය වූ බව පෙනේ. ඒ අනුව හින්දු ආගමික චාරිත්‍රයක් වන ගෝදානය බෞද්ධාගමික ආභාසය යටතේ විකාශනය වූ අන්දම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අධ්‍යයන අරමුණ විය. මෙහිදී පර්යේෂණ ගැටළුව බවට පත්වූයේ ගෝදාන චාරිත්‍රය බෞද්ධාගමික ආභාසය යටතේ විකාශනය වීමේදී ඒ සඳහා එක් වූ නව අංග කවරේද යන්න අධ්‍යයනය කිරීමයි. සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කිරීම සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් මෙහිදී යොදාගැනිණි. මෙම අධ්‍යයනයේදී පැහැදිලි වූයේ මරණාසන්න පුද්ගලයෙකු විසින් භික්ෂූන් වහන්සේ උදෙසා ගවයන් පූජා කිරීම පමණක් නොව දානයක් පිරිනමා මතක වස්ත්‍ර පූජා කිරීම, විහාරයේ කටයුතු සඳහා ගරු භාණ්ඩ හා කෙත්වතු පූජා කිරීම ද ගෝදානයේදී සිදුව ඇති බවයි. වර්තමානය දක්වා සජීවී චාරිත්‍රයක් වශයෙන් පවතින ගෝදානය පැවැත්වීමේ ප්‍රධාන අරමුණු බවට පත්ව ඇත්තේ මරණාසන්න තැනැත්තාගේ පරලොව දිවිය සැපවත් කිරීම සහ ඔහුට හෝ ඇයට මානසික සුවයක් ලබාදීම ය. ඒ හැරුණුවිට මරණාසන්න තැනැත්තා විසින් අවසන්වරට සියලුම ඥාතීන්ගෙන් සමුගැනීම මේ අවස්ථාවේදී සිදුකරනු ලබයි. ඉන් වක්‍රාකාරව ගෝදාන චාරිත්‍රය මීළඟ පරපුරට සම්ප්‍රේෂණය වීමක් ද සිදුවේ.***

*ප්‍රමුඛ පදඃ ගෝ දානය, ජීව දානය, උඩරට සමාජය, පැරණි සිරිත් විරිත්*

## හැඳින්වීම

මිනිසාගේ උපතේ සිට මරණය දක්වා වූ විවිධ අවස්ථා සඳහා ආගමික දායකත්වයක් ලබාදීම ලොව සෑම ආගමකම පාහේ දැකගත හැකි ලක්ෂණයකි. ආගමික මුහුණුවරකින් එම චාරිත්‍ර ඉටුකිරීම මගින් ආශිර්වාදය, රැකවරණය, නීරෝගීකම යනාදිය මිනිසා බලාපොරොත්තු වී ඇති බව පෙනේ. උදාහරණ වශයෙන් ගත් කළ හින්දු ධර්මයට අනුව දරුවෙකු පිළිසිඳ ගත් අවස්ථාවේ සිට ඔහුගේ මරණය දක්වා මුළු ජීවිත කාලය පුරා අනුගමනය කළ යුතු 'සංස්කාර' නමින් හැඳින්වෙන ආගමික වත්පිළිවෙත් ගණන හතළිහකි. 'ගර්භදාන' (දරු ගැබක් පිහිටි විට), 'ජාතකර්ම' (දරුවා උපන් අවස්ථාවේදී), 'නාමකරණ' (දරුවාට නම් තැබීම), 'උපනයන' (පුන නූල පැළඳවීම) ආදිය සංස්කාර කිහිපයකට උදාහරණ වශයෙන් දැක්විය හැකිය (බෂාම්, 1995). මෙම හින්දු සංස්කාරයන්හි ආභාසය භාරතයේ ජනිත වූ බුදුදහමට හිමිවුව ද, ආගමික බලපෑම්වලින් මිනිසාගේ සමාජ ජීවිතය සංකීර්ණ කිරීමට භික්ෂූන් වහන්සේ කටයුතු කර ඇති බවක් නොපෙනේ. එහිදී බුදුදහමෙන් හඳුන්වා දී තිබුණේ දරුවා ඉපදීමට ආසන්න කාලයේ පටන් ඔහුගේ මරණය දක්වා ජීවිතයේ ප්‍රධානතම අවස්ථාවලදී පමණක් ඉටු කළයුතු චාරිත්‍රවාරිත්‍ර කිහිපයකි. එම චාරිත්‍රවාරිත්‍ර සෑමවිටම පාහේ ඉටුකරන ලද්දේ බෞද්ධාගමික මුහුණුවරක් යටතේ ය. උදාහරණ වශයෙන් දරුවෙකු උපන් අවස්ථාවේදී පවත්වන සිරිත්, මල්වර සිරිත්, විවාහ මංගල සිරිත් හා අවමංගල සිරිත් යනාදිය දැක්විය හැකිය (ශ්‍රී විමලකීර්ති උදිත හිමි, 1989) ගෝදාන චාරිත්‍රය ද එලෙස බෞද්ධාගමික මුහුණුවරක් ආරෝපණය කොට මරණාසන්න පුද්ගලයන් වෙනුවෙන් සිදු කෙරුණු හින්දු චාරිත්‍රයකට නිදසුනකි.

## ගෝදානය

ගෝදානය යන පදයේ සරල නිරුක්තිය වශයෙන් ගවයන් පිරිනැමීම යන අර්ථය ගත හැකිය. ශබ්දකෝෂාර්ථය බැලීමේදී *ශ්‍රී සුමංගල ශබ්දකෝෂය* - එය ගවයන් දීම, මරණාසන්න වූවෙකු විසින් දෙන දානය (ගවයෙකු දුන් හෙයින් මෙනම් වීය) (සෝරත හිමි, 2013), *සංක්ෂිප්ත සිංහල ශබ්දකෝෂය* - ග්‍රහ අපල දුරුවීම සඳහා ජීව දානයක් වශයෙන් ගවයන් දන්දීම, ගව දානය (අබේසිරිවර්ධන, 2007) සහ *බෞද්ධ ශබ්දකෝෂය* - ගවයන් දන්දීම, ගව දානය, ග්‍රහ අපල ආදිය සඳහා කරන ශාන්ති කර්මයක් (ලියනගේ, 2010) යනාදී වශයෙන් ගෝදානය අර්ථ ගන්වා තිබේ. මෙම නිර්වචන අතුරින් බොහොමයක් භාරතීය ගෝදාන සංකල්පයට අනුව යමින් ලබා දී තිබුණ ද, බෞද්ධාගමික මුහුණුවර ලැබූ ගෝදානය යන්නෙහි අර්ථය වන්නේ මරණාසන්න වූවෙකු විසින් පවත්වනු ලබන සංඝගත දක්ෂිණාව යන්නයි. එයට ජීවදාන යන පර්යාය පදය ද භාවිත වේ (අබේසිරිවර්ධන, 2007).

**ISBN 978- 955-4563- 71- 1**

## ගෝදානයේ භාරතීය මුහුණුවර

ඉපැරණි භාරතීය සංකල්පයක් වන ගෝදානය හින්දු ආගමික ඉගැන්වීම්වල දැකිය හැකි ප්‍රධාන චාරිත්‍රයක් වශයෙන් හඳුනාගත හැකිය. ගෝදානය යන්නෙන් ගවයෙකු දන්දීම යන්න හැඟවුණු අතර මිනිසෙකු තම ජීවිත කාලය තුළ එක් වරක් හෝ මෙම චාරිත්‍රය සිදුකර තිබීම අනිවාර්ය සේ පිළිගැනිණි (*The Garuda Purana*, 2008). අතීතයේ පටන් භාරතයේ වැදගත් සත්වයෙකු වශයෙන් ගවයා පිළිගෙන තිබුණු අතර එය ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පැවති කාලය දක්වා දිවේ. එහි කැණීම්වලින් හමු වූ මොල්ලිය සහිත ගව රූ නිරූපිත මුද්‍රාවලින් එකල යම්කිසි පිළිගැනීමක් ගවයාට තිබූ බව පැහැදිලි ය (වීලර්, 2005). ඉන් අනතුරුව සංක්‍රමණික ආර්ය කණ්ඩායම් ගෝත්‍ර වශයෙන් භාරතයට පැමිණි අතර 'ගෝත්‍ර' යන්නෙහි අරුත වූයේ ගව ආරක්ෂක, ගවහල, ගව පට්ටිය යන්නයි (Williams, 1872). මෙලෙස ආර්යයන් ගෝත්‍රගතව සිටීමට බලපෑ ප්‍රධාන හේතුව ද වූයේ ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපායක් වූ ගව පාලනයයි. මෙනිසා ආර්ය සභ්‍යත්වය තුළ ගවයාට හිමිවූයේ ප්‍රමුඛස්ථානයකි. ඒ නිසා 'එළදෙන නොමැරිය යුතු සත්වයෙකි' යන පිළිගැනීම ආර්යයන් තුළ පැවති බව *ඍග්වේදයේ* එළදෙන හඳුන්වන 'අඝ්න්‍ය' (නොමැරිය යුතු) යන යෙදුමෙන් පැහැදිලි වේ. ආර්යයන් ගව මස් අනුභවයෙන් වැළකී සිටිය නමුත් ඔවුන් විසින් සිදුකරනු ලැබූ යාග අවස්ථාවලදී බිල්ලක් වශයෙන් යොදාගත් එළදෙනකගේ මස් අනුභව කිරීමට කිසිදු තහනමක් නොතිබිණි. එහෙත් ඔවුන් සැමවිටම පාහේ යාගයක් සඳහා භාවිත කරන ලද්දේ වඳ එළදෙනකි (*The Rig-Veda*, 2009), (බෂාම්, 1995). පශ්චාත් වෛදික යුගය එළඹෙන විට විනිමය මාධ්‍යයක් වශයෙන් ද ගවයා යොදාගැනුණේ ගවයාගේ වටිනාකම තවත් ඉහළ ගොස් තිබීම හේතුවෙනි. එපමණක් නොව භාණ්ඩ ප්‍රවාහනය, මස් හා කිරි ලබාගැනීම, සම් ලබාගැනීම ආදී කටයුතු රැසකට ගවයා මහෝපකාරී වී තිබුණි. (බෂාම්, 1995). මේ නිසා විශේෂ වේද මන්ත්‍ර පවා නිර්මාණය වූයේ 'ගවයන්ගෙන් අපව සරුසාර කරන්න' යනුවෙන් දෙවියන්ගෙන් අයදිමිනි. ඒ යටතේ ගවයන් බෝකිරීම හා සම්බන්ධ විවිධ චාරිත්‍ර වාරිත්‍ර ඇතිවුණි. එසේම හින්දු ත්‍රිමූර්තියෙන් එක් අයෙකු වන ශිව දෙවියන්ගේ වාහනය ලෙස නන්දි නම් ගවයා පිළිගැනුණු හෙයින් ගවයන් සහ එළදෙනුන්ට විශේෂ ගරු සත්කාර පැවැත්විය යුතු බවට ද සමාජ සම්මතයක් පැවති බව පෙනේ (*The Hymns of the Atharvaveda*, 2009). ඉහතින් දැක්වූ අන්දමට ගවයාගේ උපයෝගීතාව තව තවත් ඉහළ ගිය හෙයින් යාගවලදී බ්‍රාහ්මණයන් උදෙසා පිරිනැමෙන දක්ෂිණාවක් බවට ද ගවයා පත්විය (*The Garuda Purana*, 2008).

ඒ අනුව මිනිස් දිවියේ විවිධ අරමුණු මුල්කොටගෙන හින්දු ආගමේ පූජක පක්ෂය වශයෙන් සැලකෙන බ්‍රාහ්මණයන්ට ගවයන් පූජා කිරීම තුළින් බිහිවූයේ ගෝදානය නම් චාරිත්‍රයයි. මිනිසෙකුට තම ජීවිත කාලය තුළ විවිධ අරමුණු කිහිපයක් මුල්කොටගෙන වරින්වර ගෝදාන පැවැත්වීමේ අවකාශය ඒ යටතේ හින්දු ආගමෙන් හිමිකර දී තිබුණි. එකී අවස්ථා මෙසේ යඃ

> පාප් ධේනු දාන් - පාපයෙන් නිදහස් වීම සඳහා
> කර්ජ් මුක්ති ධේනු දාන් - ණයවලින් නිදහස් වීම සඳහා
> මෝක්ෂ ධේනු දාන් - මෝක්ෂය ලබා ගැනීම සඳහා
> ප්‍රයශ්චිත් ධේනු දාන් - ක්ෂමාව ලබා ගැනීම සඳහා
> වෛතරණි ධේනු දාන් - ජීවිතයේ අවසන් දින කිහිපය තුළ මෝක්ෂය ලබාගැනීම සඳහා

(Agrawal, 2010)

ඉහත දැක්වුණු අවස්ථාවලදී ඒ ඒ අරමුණු සිහිපත් කරමින් අං රන් හෝ පිත්තල සහ මුතුවලින් ද, ගෙල මල්දම්වලින් ද, ශරීරය නව වස්ත්‍රවලින් හා නොයෙක් ආභරණවලින් සරසන ලද පැටියෙකු සහිත ගවදෙනක් ගෙනවිත්, පූජා කරන්නා වල්ගයෙන් අල්ලා සිටියදී මන්ත්‍ර සජ්ඣායනා මධ්‍යයේ අත පැන් වත්කොට බ්‍රාහ්මණයෙකු වෙත පූජා කර තිබේ (ශ්‍රී විමලකීර්ති උදිත හිමි, 1989). මෙහිදී කුමන අරමුණක් මුල්කොටගෙන හෝ ජීවිතයේ එක් වරක්වත් බ්‍රාහ්මණයෙකු උදෙසා ගවයෙකු පූජා කරන පුද්ගලයාට බ්‍රහ්ම, විෂ්ණු, ඊශ්වර, සූර්ය හා චන්ද්‍ර යන දෙවිවරුන්ගේ ආශිර්වාදය හිමිවන බව හින්දු ආගමික ග්‍රන්ථ දැක්වේ (Agrawal, 2010). මේ හැරෙන්නට ගෝදානයක් පැවැත්වූ අයෙකු මරණයට පත්වූ විට, ඔහුට අපායෙන් (යමලොව) මිදීමට හැකියාව ලැබෙන බව ද හින්දු විශ්වාසයයි. එහිදී මරණයට පත්වූවන් තරණය කළ යුතු අපායේ ගිනි ගංගාවෙන් අපහසුවකින් තොරව එතෙර වී නිදුක් ස්ථානයකට යාමට ඉවහල් වන්නේ ගෝදානයයි (Langer, 2007). එපමණක් නොව හින්දු දහමේ ඉගැන්වෙන දස දානයෙන් (ගව දෙනුන්, ඉඩම්, රන්, රිදී, ගිතෙල්, වස්ත්‍ර, ධාන්‍ය, සීනි, තල, ලුණු) පළමු වැන්න ලෙස ගෝදානය දක්වා තිබෙන අතර බමුණන්ට දස දානය පිදීම මරණින් පසු දේව වරප්‍රසාද ලබාගත හැකි මාර්ගය වශයෙන් පිළිගැනේ (ශ්‍රී විමලකීර්ති උදිත හිමි, 1989).

**ISBN 978- 955-4563- 71- 1**

## ගෝදානයේ ලාංකික මුහුණුවර

භාරත-ලංකා සබඳතා හේතුවෙන් මෙරටට පැමිණි ගෝදාන චාරිත්‍රය මුල්කාලීනව භාරතීය මුහුණුවරින්ම ක්‍රියාත්මක වන්නට ඇත. එයට හේතුව නම් ලංකාවේ රජවරුන්ගේ පුරෝහිත, ගුරුවරයා සහ අමාත්‍ය යනාදී තනතුරු දරූ උපතිස්ස, පණ්ඩුල, චන්ද්‍ර හා තාලිපබ්බත වැනි බමුණන් එකල ලංකාවේ වාසය කිරීමයි. මෙනිසා බොහෝ කටයුතු බ්‍රාහ්මණ ධර්මවලට අනුකූලව ඉටුවන්නට ඇත. එය පැහැදිලි වන්නේ ලංකාවේ රජවරුන් ද බ්‍රාහ්මණයන්ගේ ආගමික කටයුතු උදෙසා සිවිකා ශාලා, සොත්ථිශාලා වැනි ආගමික ගොඩනැගිලි ආදිය ඉදිකරවූ බව වංසකතාවල සඳහන්වීමයි (*වංසත්ථප්පකාසිනී-මහාවංස ටීකාව*, 1994). මෙරට කෘෂිකාර්මික අර්ථක්‍රමයක් පැවතීම හේතුවෙන් ගවයාට ප්‍රමුඛස්ථානයක් හිමිවුණු අතර ගවයා පිළිගැනුණේ ගොවියාගේ මිතුරෙකු වශයෙනි. ඒ පසුබිම මත භාරතයේ ගෝදානයට හිමි වූ පිළිගැනීම ලංකාව තුළ ද එලෙසින්ම ස්ථාපනය වන්නට ඇත. එහෙත් කල් යාමේදී පුළුල් බෞද්ධාගමික මුහුණුවරක් සහිත ආගමික චාරිත්‍රයක් බවට ගෝදානය පත් වූ බව පෙනේ. එසේ වුවත් පෙර පරිදිම බමුණන් උදෙසා ගවයන් පූජාකරමින් ගෝදාන පැවැත්වීම අඛණ්ඩව සිදු කෙරුණු බවට සාධක හමුවේ. ඊට නිදසුනක් වන්නේ ගම්පොළ යුගයේදී මෙහෙණවර වංශික වීරබාහු නම් ඇපාණන් විසින් බ්‍රාහ්මණයන්ට දන්දීමේදී ගෝදාන පැවැත්වූ බවට *නිකාය සංග්‍රහයේ* එන සඳහනයි (*නිකාය සංග්‍රහය*, 2008).

දේශීය ලක්ෂණ සංකලනය කෙරුණු බෞද්ධාගමික මුහුණුවරක් සහිත ගෝදානය චාරිත්‍රයේදී සිදුවූයේ මරණාසන්න වූවෙකු විසින් මරණයට පෙර සාංඝික දානයක් පිරිනමනු ලැබීමයි. මේ සඳහා ජීවදානය යන පර්යාය නාමය ද භාවිත වී තිබේ (අබේසිරිවර්ධන, 2007). බොහෝ විට මේ අවස්ථාවේදී ගවයෙකු වැඩ කටයුතුවලින් නිදහස් කොට අභයදානය ලබාදීම සිදු වූ හෙයින් ජීවිතය දානය කිරීම යන අදහසින් ජීවදානය යන පදය භාවිත වන්නට ඇත. එසේම මරණාසන්න පුද්ගලයාගේ ජීවිතය වෙනුවෙන් ගවයෙකු හෝ සාංඝික දානයක් දෙන හෙයින් ජීවදානය යන යෙදුම ඒ සඳහා ගැලපෙන බව පෙනේ (Langer, 2007). දඹදෙණි සමයේදී ලියැවුණු *සද්ධර්මරත්නාවලියේ* පියෙකුගේ මරණාසන්නයේදී පුතෙකු විසින් දෙනු ලැබූ දානයක් පිළිබඳ දැක්වෙන සඳහනේ 'ආසන්න කර්ම' නමින් හඳුන්වා ඇත්තේ ද මෙකී ගෝදාන චාරිත්‍රය විය යුතු යැයි මහාචාර්ය ඇම්.බී. ආරියපාල දක්වයි. මේ හැරෙන්නට *ධම්මපදට්ඨකථාවේදී* ගෝදානය 'ජීවභත්ත' නමින් හඳුන්වා ඇතැයි මහාචාර්ය ආරියපාල වැඩිදුරටත් සඳහන් කරයි (ආරියපාල, 2014). උඩරට රාජධානි සමයේදී බහුලව සිදුකෙරුණු ගෝදාන චාරිත්‍රය වර්තමානයේදී ද උඩරට සහ නුවර කලාවිය ප්‍රදේශවල අඛණ්ඩව සිදුකරනු දැකිය හැකිය. එහිදී පවුලේ සාමාජියෙකු මරණාසන්න තත්ත්වයේ පසුවන විට, පවුලේ අය විසින් ගමේ පන්සලේ භික්ෂූන් වහන්සේ නිවසට වැඩම කරවා ගෝදාන චාරිත්‍රය පවත්වන්නට කටයුතු කර තිබේ. ඒ යටතේ සාංඝික දානයක් පවත්වා අනතුරුව භාරතීය ආභාසය අනුව යමින් ගවයෙකු පූජා කෙරේ. ඊට අතිරේකව විහාරස්ථානයේ කටයුතු සඳහා අවශ්‍ය කරන භාණ්ඩ පූජා කිරීම ද සිදුව තිබේ (පීරිස්, 2005).

අතීතයේ පැවති ගෝදාන උත්සවයක් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් මධ්‍යම පළාතේ ඒජන්තවරයා වශයෙන් සේවය කළ ශ්‍රීමත් ජේ.එෆ්. ඩික්සන් විසින් වර්ෂ 1884 රාජකීය ආසියාතික සංගමයේ සඟරාවට ඉදිරිපත් කර තිබේ. එය පිරික්සන විට පැහැදිලිවන්නේ ගෝදානය හුදෙක් සාංඝික දානයකට පමණක් සීමා නොවූ බවයි. මේ පිළිබඳ සවිස්තරාත්මක සටහනක් මහාචාර්ය රැල්ෆ් පීරිස් විසින් රචිත *Sinhala Social Organisation* කෘතියේ ඇතුළත් වන්නේ මෙපරිද්දෙනි (පීරිස්, 2005). ඩික්සන් දක්වන අන්දමට නොබෝ දිනකින් තමන් මරණයට පත්වේයැයි යමෙකුට හැඟෙන අවස්ථාවේදී ඔහු විසින් ඒ බව පවුලේ අයට දැනුම් දෙනු ලබයි. එවිට ඔහුගේ දූ දරුවන් සහ ඥාතීන් සූදානම් වන්නේ ගෝදාන පිංකම පැවැත්වීමටයි. එහිදී පිංකම පැවැත්වීමට දින කිහිපයකට පෙර ඒ බව ගමේ විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේ වෙත දැනුම් දීම පැවති සිරිතයි. පිංකම පැවැත්වීමට නියමිත දිනයේ සවස මරණාසන්න පුද්ගලයාගේ දූ දරුවෝ සහ ඥාතීහු ගිලන්පස පූජාවක් පැවැත්වීමට අවශ්‍ය පාන වර්ග සහ තෙල්, මල්, සුවඳ දුම් රැගෙන විහාරයට ගොස් ඒවා පූජාකොට බුද්ධ පූජා පවත්වති. අනතුරුව ලැගුම්ගෙට ගොස් භික්ෂූන් වහන්සේ වන්දනා කරන පිරිස පෙරහැරින් භික්ෂූන් වහන්සේ සහ ධර්ම පුස්තකය නිවසට වැඩම කරවනු ලබයි. ඒ වනවිටත් ධර්ම දේශනාව පැවැත්වීමට උදෙසා තාවකාලික ධර්ම ශාලාවක් නිවසේ පිළියෙලකොට තිබේ. නිවසට වැඩම කළ භික්ෂූන් වහන්සේ උදෙසා පළමුව ගිලන්පස පූජා කෙරෙන අතර ඉන්පසු දහම් ඇසීමට මරණාසන්න තැනැත්තා සහ අනෙක් අය සූදානම් වේ. භික්ෂූන් වහන්සේ විසින් *සද්ධර්මරත්නාවලිය* වැනි ධර්ම ග්‍රන්ථයක් කියවා එහි සරල අරුත පිරිසට පහදා දෙනු ලබයි. මෙම ධර්ම දේශනාව ඉංග්‍රීසි පැය හයක පමණ කාලයක් පැවැත්වේ. අවසානයේදී භික්ෂූන් වහන්සේ වැඩ වසන විහාරය නිවස සමීපයේ පිහිටියේ නම් රාත්‍රියේ උන්වහන්සේ පෙරළා විහාරයට වැඩම කරවන අතර නැත්නම් රාත්‍රිය නිවසේම ලැගුම් ගනී. පසුදා උදෑසන හීල් දානය සහ දහවල් දානය උන්වහන්සේ උදෙසා

**ISBN 978- 955-4563- 71- 1**

ඉතාමත් සැලකිල්ලෙන් පූජා කිරීමට දායකයෝ කටයුතු කරති. දන් වැළඳීම අවසානයේදී පරිෂ්කාර වශයෙන් පූජා කර ඇත්තේ භික්ෂූන් වහන්සේට මෙන්ම විහාරයට අවශ්‍ය දෑ ය. ඩික්සන් නිරීක්ෂණය කරනු ලැබූ ගෝදාන පිංකමේදී භික්ෂූන් වහන්සේට බුලත් කිල්ලෝටයක්, පැදුරක්, කොට්ටයක්, බේසමක්, පලංගානක්, පිත්තල පූකුරුවක්, පහනක්, පඩික්කමක්, කැත්තක්, උදැල්ලක්, වෑයක්, පොරොවක්, කියතක් මෙන්ම පළතුරු හා ආහාර ද්‍රව්‍ය ආදී එදිනෙදා පරිභෝජනයට අවශ්‍ය බොහෝ ද්‍රව්‍ය පූජාකොට තිබේ. පරිෂ්කාර වශයෙන් පූජා කළ ද්‍රව්‍ය සියල්ලම භික්ෂූන් වහන්සේ ඉදිරියේ තැන්පත් කිරීම ඒ අවස්ථාවේදී සිදුවේ.

අනතුරුව එළඹ ඇත්තේ ගෝදාන චාරිත්‍රයේ වැදගත්ම අංගය වන මතක වස්ත්‍ර පූජා කිරීම බව ඩික්සන් සඳහන් කරයි. පුද්ගලයෙකු මියගිය පසු පවත්වන ආගමික චාරිත්‍රයක් වූ පාංශුකූලය දීමේදී සිදුවන්නේ සුදු රෙදි කඩක් මතක වස්ත්‍ර වශයෙන් පූජා කිරීමයි. ගෝදාන පිංකමේ විශේෂත්වය වනුයේ පුද්ගලයා ජීවත්ව සිටියදීම මතක වස්ත්‍ර පූජා කිරීමට හැකියාව ලැබීමයි. ඩික්සන් නිරීක්ෂණය කළ ගෝදාන පිංකමේදී රියන් දහසයක් හෝ විස්සක් දිග කපු රෙදි කඩක එක් කොණක් භික්ෂූන් වහන්සේ අතට දී අනෙක් කොණ අල්ලාගත් මරණාසන්න පුද්ගලයාගේ ඥාති පිරිස පහත වාක්‍ය කියා තිබේ.

'සැරියුත් මුගලන් ආදී මහා සංඝයාගෙන් අවිච්ඡින්නව පැවත එන මහා සංඝයා වහන්සේ වෙනුවෙන් ඔබ වහන්සේට කරනු ලබන මෙකී පූජාව හේතු කොටගෙන අපගේ පියාණන් වූ පුංචිරාලට මරණින් මතු සදිව්‍ය ලෝකයේ උත්පත්තිය ලැබ අවසානයේදී මෝක්ෂ්‍ය සංඛ්‍යාත නිර්වාණය අත්පත් කරගැනීමට හේතු වාසනා වේවා' ඉන්පසු එම සුදු රෙදිකඩ භික්ෂූන් වහන්සේට පූජා කරන අතර එය පිළිගත් උන්වහන්සේ විසින් පහත දැක්වෙන ගාථාව සජ්ඣායනය කරනු ලබයිඃ

ඉච්ඡිතං පත්ථිතං තුය්හං - ඛිප්පමෙව සමිජ්ඣතු
සබ්බෙ පූරෙන්තු චිත්ත සංකප්පා - ඡන්දො පණ්ණ රසී යථා
පනාමෙන සාරං සරීරස්ස ධීරං - පදානෙන දානං ධනානං සපඤ්ඤො
සුසීලෙන සාරං සදා ජීවිතසස - ගහාතෙන විඤ්ඤූ න සොචන්ති පච්චා

මෙකී පුණ්‍යානුමෝදනාවෙන් අනතුරුව භික්ෂූන් වහන්සේ, උන්වහන්සේට පූජා කෙරුණු පූජා ද්‍රව්‍ය ද සමඟ පෙරළා පෙරහැරින් විහාරයට වැඩම කරවනු ලැබෙයි. මෙයින් ගෝදාන පිංකම අවසන් වේ. එහෙත් සැබවින්ම එය නිමාවන්නේ මරණාසන්න පුද්ගලයා මරණ මංචකයේ සිටින අවස්ථාවේදී ගමේ විහාරයෙන් භික්ෂූන් වහන්සේලා සිදුකරන ආගමික වතාවත්වලින් බව ඩික්සන් සඳහන් කරයි. එහිදී සිදුව ඇත්තේ භික්ෂූන් වහන්සේ නමක් නිවෙසට වැඩම කරවා මරණාසන්න තැනැත්තා තිසරණ සහිත පංචසීලයේ පිහිටුවා අනතුරුව සතිපට්ඨාන සූත්‍රය සජ්ඣායනය කිරීම ය (පීරිස්, 2005). ඩික්සන්ගේ වාර්තාවේ දැක්වෙන ගෝදාන පිංකමේදී බුදුදහමේ ඉගැන්වෙන දස පුණ්‍ය ක්‍රියාවලට අයත් වන ධර්ම දේශනා පැවැත්වීම සහ සාංඝික දානය පැවැත්වීම යන පුණ්‍ය ක්‍රියා ද්විත්වයම සිදුකොට තිබෙන බව පෙනේ (චන්ද්‍රවිමල හිමි, 2009). එපමණක් නොව මරණාසන්න තැනැත්තාගේ සිත දහම කෙරෙහි පැහැදවීම සහ මරණය පිළිබඳ හටගන්නා බිය තුනී කිරීම ද ගෝදාන පිංකම පැවැත්වීමෙන් අපේක්ෂා කළ බව සිතිය හැකිය.

මරණාසන්න තැනැත්තාගේ වත්පොහොසත්කම අනුව ද ගෝදාන පිංකමට විවිධ වෙනස්කම් එක්ව තිබේ. දුල්දෙණියේ හිත්තරගෙදර රං නයිදේ නම් උපාසක මහතා විසින් හෙම්මාතගම අඹරේගොඩ විහාරස්ථානයේදී පැවැත්වූ ගෝදාන පිංකම එයට නිදසුනකි. වෙසක් පුර පසළොස්වක පොහොය දිනකදී විහාරස්ථ බණ මඩුවේ පැවැත්වූ මෙකී ගෝදාන පිංකමේදී ඔහු විසින් විහාරයට අවශ්‍ය සියලුම ගරු භාණ්ඩ පූජා කරනු ලැබ තිබේ. හැලි වලං, පිත්තල කිල්ලෝට, බුලත් හෙප්පු, පිත්තල ගිර, බෙහෙත් මංජුසා, පිත්තල බුලත් වංගෙඩි, දැව වංගෙඩි, හක්ගෙඩි, මුතු කුඩ, සේසත්, මුරායුධ, කොට්ට මෙට්ට, පැදුරු දැව භාණ්ඩ ආදිය ඇතුලුව ඉදිකටුව දක්වා වූ විහාරයට අවශ්‍ය සියලුම භාණ්ඩ එයට අයත්ව තිබී ඇත. අද දක්වාම භාවිතයේ පවතින එකී භාණ්ඩ සමහරෙක 'දු.හි.රං.' යන අකුරු ත්‍රිත්වය කොටා ඇත්තේ දුල්දෙණියේ හිත්තරගෙදර රං නයිදේ විසින් සිදුකළ මෙකී පින්කම සිහිපත් කරවනු පිණිස ය (බණ්ඩාර, 2011).
මේ හැරෙන්නට වත්පොහොසත්කම අනුව වෙනස්කම්වලට ලක් වූ ගෝදාන පිංකමට තවත් නිදසුනක් සූරියගොඩ ශ්‍රී නරේන්ද්‍රාරාම රජමහ විහාරයෙන් හමුවන ගෝදාන පත්‍රයකින් දැකගත හැකිය. ශක වර්ෂ 1776 දී (ක්‍රි.ව.1854) සිඟුරුවානබඳ යටිනුවර ගඟ පළාතේ පිලපිටියේ වාසය කළ පුංචිරාළ ආරච්චිලගේ භාර්යාව වූ රංමැණිකා විසින් ඇගේ මුණුපුරා සහ ඥාතීන් පිරිසකගේ සහභාගීත්වයෙන් ගෝදාන පිංකමක් පැවැත්වූ බව එහි සඳහන් වේ. එම පිංකම සඳහා මල්ගම්මන,

**ISBN 978- 955-4563- 71- 1**

නිලගම, ඊරිගම, කිරිබත්කුඹුරේ, හිප්පල, සූරියගොඩ සහ මුරුතැන්ගේ යන භික්ෂූන් වහන්සේ වැඩම කර තිබේ. උන්වහන්සේ උදෙසා පැවැත්වූ සාංඝික දානයෙන් අනතුරුව රංමැණිකා විසින් ස්වාමි පුරුෂයාගෙන් තමන්ට උරුම වූ විල්අමුනේ නම් කුඹුර සූරියගොඩ විහාරයේ වැඩ සිටින බුද්ධ ප්‍රතිමා වහන්සේට බුද්ධ පූජාව පැවැත්වීමට සහ විහාරයේ වැඩ සිටින භික්ෂූන් වහන්සේගේ දානය උදෙසා සහල් සපයා ගැනීමට පූජා කර ඇත්තේ ස්වර්ග මෝක්ෂ සම්පත්තිය ප්‍රාර්ථනා කරමිනි (සූරියගොඩ ශ්‍රී නරේන්ද්‍රාරාම රජමහා විහාරය සතු ගෝදාන පත්‍රයක් ඇසුරිනි) ඩික්සන්ගේ වාර්තාවේ දැක්වෙන අන්දමට චංචල දේපළ පමණක් නොව නිශ්චල දේපළක් පූජා කිරීම ද ගෝදානයේදී සිදුවුණු බව මින් පැහැදිලි වේ. උඩරට රජුගේ සිරකරුවෙකුව කලක් රැඳී සිටි ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස් දක්වන අන්දමට උඩරට රාජධානි සමයේ නිශ්චල දේපළක් පැවරීමේ ක්‍රමවේදය වී ඇත්තේ ඒ පිළිබඳ තල්පතක ලියා ප්‍රදේශයේ පිළිගත් ප්‍රභූවරුන් කිහිපදෙනෙකුගේ අත්සන් යොදා තහවුරු කරවීම ය (Knox, 2004). රංමැණිකා ද එම පිළිවෙත අනුව යමින් ඉහතින් සඳහන් කළ භික්ෂූන් වහන්සේට අතිරේකව ගෝදාන පිංකමට සහභාගි වූ ඇගේ මුණුපුරා වූ පුංචිරාළ, පිලපිටියේ ගෙදර පුංචිරාළ, ගමගෙදර කීරාළ, කළුබණ්ඩා සහ අප්පුහාමි යන අයගේ අත්සන් යොදා එම පූජාව තහවුරු කර තිබෙනු ගෝදාන පත්‍රයේ දකගත හැකිය. එයින් 'ගෝදාන පත්‍ර' නම් ලියවිලි විශේෂයක් මෙරට ගෝදානය හා සම්බන්ධව පැවති බවට සාක්ෂි හමුවේ (ඤාණවිමල හිමි, 2001). එවැනි ගෝදාන පත්‍ර විශාල ප්‍රමාණයක් මේ වන විට පැරණි විහාරස්ථානවලින් හමුව තිබේ (Langer, 2007).

ගෝදාන චාරිත්‍රය හුදෙක් ගිහියන්ට පමණක් සීමා නොවූ, භික්ෂූන් වහන්සේ අතර පවා ජනප්‍රියව පැවති පිංකමක් බවට තොරතුරු හමුවේ. දහඅටවන සියවසේ අග භාගයේදී හරංකහවේ බුද්ධරක්ඛිත නම් භික්ෂූන් වහන්සේ විසින් රචනා කරන ලද ස්වකීය පිං පොතේ තමන්වහන්සේ විසින් ගෝදාන පිංකමක් සිදුකළ බව දක්වා තිබීම එයට නිදසුනකි. ඒ හැරෙන්නට උන්වහන්සේ විසින් දළදා වහන්සේ උදෙසා එළදෙකන පූජා කරනු ලැබූ බව ද පිං පොතේ සඳහන් වේ (*හරංකහවේ බුද්ධරක්ඛිත ස්වාමීන්ගේ පිංපොත*, 2012). මේ අනුව, ගෝදානය පිංකමක් සිදුකොට තමන්ගේ පරලොව දිවිය වෙනුවෙන් පිං රැස්කරගැනීමට ගිහි පැවිදි දෙපාර්ශවයම පෙළඹුණු බව නිගමනය කළ හැකිය.

**වර්තමානයේදී පැවැත්වෙන ගෝදාන චාරිත්‍රය**

වර්තමානයේ පැවැත්වෙන ගෝදාන පිංකම් පිළිබඳ විමසා බැලීමේදී එය බොහෝවිට භික්ෂූන් වහන්සේට දානයක් පිරිනමා, මතක වස්ත්‍ර පූජා කිරීමකට පමණක් සීමා වී තිබේ. විටෙක සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවක් පවත්වා පසුදා සංඝගත දක්ෂිණාවක් පිරිනැමීම ද සිදුවන බව පෙනේ (උග්ගල් අලුත්නුවර එම්.පී.පී. ගුණසිංහ සමග 2014.08.22 සහ 2014.09.12 දින සංවාදය). මේ චාරිත්‍රය පිළිබඳ අධ්‍යයනයක් කළ මහාචාර්ය ඇම්.බී. ආරියපාල දක්වන්නේ ගෝදානය වශයෙන් සමහර පළාත්වල භික්ෂූන් වහන්සේ නමකට රෙදි කඩක් දන්දීමත්, තවත් පළාත්වල දානයකින් අනතුරුව රෙදිකඩක් පූජා කිරීමත් සිදු කෙරෙන බවයි (ආරියපාල, 2014).

මේ හැරෙන්නට උතුරු මැද පළාතේ පවත්වන ගෝදාන පිංකමේදී ඒ සඳහා මුල්වන පුද්ගලයාගේ උසට සමාන රෙදිකඩක් භික්ෂූන් වහන්සේට පූජා කිරීම සිදුකෙරේ. ජීවදානය නමින් ව්‍යවහාර කෙරෙන ගෝදාන පිංකම, උතුරු මැද පළාතේ අවසන් වන්නේ රාත්‍රී ධර්මදේශනාවක් පවත්වා පසුදා හීල් දානය සහ දවල් දානය භික්ෂූන් වහන්සේට පිරිනැමීමෙනි (කපිරිග්ගම උක්කුබණ්ඩාගේ අප්පුහාමි සමග 2015.03.14 දින සංවාදය).

මහාචාර්ය සෙනෙවි එපිටවත්ත විසින් දඹුල්ල ප්‍රදේශයේ ඇඹුල්අඹේ ග්‍රාමය ආශ්‍රිතව සිදුකරන ලද මානව විද්‍යාත්මක අධ්‍යයනයකදී එකී ග්‍රාමයේ පැවති ජීවදාන චාරිත්‍රය පිළිබඳ පහත තොරතුරු දක්වා තිබේ. එහිදී සෑම වයස්ගත ගම්වාසියෙකුගේම මරණයට පෙර ඔහු හෝ ඇයගේ මූලිකත්වයෙන් අටපිරිකර පූජාවක් හෝ වෙනත් බලගතු පින්කමක් සිදුකිරීම දූ දරුවන්ගේ වගකීමක් වී ඇත. ජීවදානය හෝ අවසාන පින්කම යන නමින් හඳුන්වන එකී පින්කමේදී සිදුව ඇත්තේ භික්ෂූන් වහන්සේ එක් නමක් හෝ කීප නමක් නිවෙසට වැඩම කරවා පිරිත් හෝ බණ දේශනා කරවාගෙන අටපිරිකරක් පූජාකිරීමයි. මරණාසන්න පුද්ගලයා සතු වත්කම් පින්කම සඳහා වැඩම කරවන භික්ෂූන් වහන්සේලා ගණන වැඩිවීම හෝ පිරිකර ආදියේ වටිනාකම තීරණය වීමට බලපා තිබේ. ඉන් අනතුරුව ඔවුන් සතුටින් පසුව ඇත්තේ ඕනෑම අවස්ථාවක තමන්ගේ මරණය අපේක්ෂාවෙනි. මේ හැරුණු විට ගම්වාසීන් විසින් දරුණු රෝගයකින් මරණාසන්නව පසුවන රෝගීන් උදෙසා ද මෙකී පින්කම පවත්වා ඇත්තේ ඔවුන්ගේ පව් සමා කරවීමේ අපේක්ෂාවෙනි. ජීවදාන පින්කම සිදුකිරීමේදී ඒ සඳහා ඥාතීන් සහ අසල්වාසීන් සහභාගි කරවාගැනීමේ සිරිතක් ද

**ISBN 978- 955-4563- 71- 1**

ඇඹුල්අඹේ ගම්වාසීන් තුළ පැවති බව මහාචාර්ය එපිටවත්ත වැඩිදුරටත් සඳහන් කරයි (එපිටවත්ත, 2006).

## නිගමනය

මෙරට සංස්කෘතිය තුළ අවිච්ඡින්න සම්ප්‍රදායක් වශයෙන් පැවත එන ගෝදාන පිංකම තුළින් අරමුණු කිහිපයක් ඉටු කෙරෙන බව පෙනේ. තමන්ගේ මරණයට පෙර සංඝගත දක්ෂිණාවක් පිරිනමා, මතක වස්ත්‍ර පූජා කිරීම තුළින් පරලොව දිවිය වෙනුවෙන් පිං රැස්කරගැනීම එහි මුඛ්‍ය පරමාර්ථයයි. එහිදී ගෝදාන පිංකමේ සියලු කටයුතු උදෙසා පිංකම සිදුකරන්නා පමණක් මුදල් යෙදවීම ද විශේෂත්වයකි. ගෝදානයේ විවිධ වෙනස්කම් ප්‍රාදේශීයව දකගත හැකිවුව ද, ඒ සෑම එකක්ම පාහේ බෞද්ධාගමික නැඹුරුව සහිත භික්ෂූන් වහන්සේගේ සහභාගීත්වයෙන් සිදුකරනු ලබන බව පෙනේ. ගෝදානය පිංකම පැවැත්වීමේදී ඒ සඳහා ඥාතී හිතෛෂීන් සියලුදෙනාම සහභාගි කරවා ගන්නා හෙයින් මරණය අපේක්ෂාවෙන් සිටින්නා මරණයට පෙර සියලු දෙනාගෙන්ම සමුගැනීම සිදුකිරීම ද මෙහිදී සිදුවේ. ඒ හැරෙන්නට පාරම්පරිකව පැවත එන සිරිතක් මීළඟ පරම්පරාව වෙත දායාද කිරීම ද ගෝදාන චාරිත්‍රය පැවැත්වීමෙන් අපේක්ෂා කෙරුණු බව සිතිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ


අබේසිරිවර්ධන, ආනන්ද ඇතුළු තවත් අය (සංස්.). (2007). *සංක්ෂිප්ත සිංහල ශබ්දකෝෂය-ප්‍රථම භාගය*. කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

ආරියපාල, ඇම්.බී. (2014). *මධ්‍යකාලීන ලංකා සමාජය*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

එපිටවත්ත, සෙනෙවි. (2006). *ඇඹුල්අඹේ ගම*. පන්නිපිටිය: ස්ටැම්ෆර්ඩ් ලේක් සමාගම.

ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (2001). *සපරගමුවේ පැරණි ලියවිලි*. නුගේගොඩ: මානව හිතවාදී ලේඛක පර්ෂදය.

*නිකාය සංග්‍රහය* (2008). ආනන්ද හිමි, කෝන්ගස්තැන්නේ (සංස්.). කොළඹ: සමයවර්ධන පොත්හල (පෞද්ගලික) සමාගම.

චන්දවිමල හිමි, රේරුකානේ (2009). *බෞද්ධයාගේ අත්පොත*. පොකුණුවිට: ශ්‍රී චන්දවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය.

පීරිස්, රැල්ෆ් (2005). *සිංහල සමාජ සංවිධානය-මහනුවර යුගය*. පෙරේරා, කේ.ඒ.ඩී. (පරි.). බොරලැස්ගමුව: සී/ස විසිදුනු ප්‍රකාශකයෝ.

බණ්ඩාර, ආර්.ඩබ්. ප්‍රියදර්ශන (2011). *එරම්ණිගම්මන හිඟුල විහාර වංසය*. අම්බරේගොඩ: ශ්‍රී බෝධිරාජාරාම විහාරීය ප්‍රකාශන.

බෂාම්, ඒ.එල්. (1995). *අසිරිමත් ඉන්දියාව*. සේනාධීර, ගුණපාල, අබේසිංහ, ටී.බී.එච්. සහ විජේතුංග, ඩබ්. එම්.කේ. (පරි.). කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ලියනගේ, සිරි (2010). *බෞද්ධ ශබ්දකෝෂය-1 කොටස*. නුගේගොඩ: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*වංසත්ථප්පකාසිනී-මහාවංස ටීකාව* (1994). අමරවංස හිමි, අකුරටියේ සහ දිසානායක, හේමචන්ද්‍ර (සංස්.). කැලණිය: පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ආයතනය.

වීලර්, මෝටිමර් (2005). ආදි ඉන්දියාව සහ පාකිස්ථානය. ගුණවර්ධන, එච්.ඩී.ජේ. (අනු.). කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

සෝරත හිමි, වැලිවිටියේ (2013). *ශ්‍රී සුමංගල ශබ්දකෝෂය-ප්‍රථම භාගය*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ශ්‍රී විමලකීර්ති උදිත හිමි, හිත්තටියේ (1989). *භාරතීය ධර්ම ශාස්ත්‍ර සහ සිංහල සිරිත් විරිත්*. කොළඹ: එම්.ඩී. ගුණසේන සහ සමාගම.

*හරංකහවේ බුද්ධරක්ඛිත ස්වාමීන්ගේ පිංපොත* (2012). බණ්ඩාර, ප්‍රියදර්ශන ආර්.ඩබ්. (සම්.). අම්බරේගොඩ: ශ්‍රී බෝධිරාජාරාම විහාරීය ප්‍රකාශන.

Agrawal, Sanjay (2010). *Daan and Other Giving Traditions in India*. New Delhi: Printworks.

Knox, Robert (2004). *An Historical Relations of Island of Ceylon*. New Delhi: Navrang.

Langer, Rita (2007). *Buddhist Rituals of Death and Rebirth*. Oxon: Routledge

*The Garuda Purana* (2008). Wood, Ernest & Subrahmanyam S.V. (Ed.). Charleston: BiblioBazaar

*The Hymns of the Atharvaveda* (2009). Griffith, Ralph T.H. (Tr.). California: Evinity Publishing Inc.

*The Rig-Veda* (2009). Griffith, Ralph T.H. (Tr.). California: Evinity Publishing Inc.

Williams, Monier (1872). *A Sanskrit-English Dictionary*. London: Oxford University Press.

**අමුද්‍රිත ලේඛන**

සූරියගොඩ ශ්‍රී නරේන්ද්‍රාරාම රජමහා විහාරය සතු ගෝදාන පත්‍රය

**සංවාද**

උග්ගල් අලුත්නුවර විශ්‍රාමලත් නියෝජ්‍ය විදුහල්පති එම්.පී.පී. ගුණසිංහ මහතා සමග 2014 අගෝස්තු මස 22 සහ සැප්තැම්බර මස 12 දින.

කල්ලංචිය, කපිරිග්ගම උක්කුබණ්ඩාගේ අප්පුහාමි මහතා සමග 2015 මාර්තු මස 14 දින.